# වල් පැළෑටි වල ජාන රැක ගනිමු

අපගේ වන ගහණයන්හි තිබෙන ජාන සමූහය ආරක්ෂා කොට පවත්වා ගැනීමේ අගය, පරිසර විද්‍යාඥයන් සහ කෘෂි විද්‍යාඥයන් විසින් හුවාදක්වනු ලබන්නේ මක්නිසාද ? අප වවා ගන්නා පැළෑටි වර්ග වලට නව ජීවනයක් දෙනු පිණිසත්, ඒවා සෞභාග්‍ය සම්පන්නව කලක් වගා කර ගෙන යනු පිණිසත්, අපට වල් පැළෑටිවල ජාන අවශ්‍යය.

''ජාන'' යනු කවරේද ? මානව, සත්ව, ශාක ආදී ඕනෑම ජීවියකුගේ සිරුරෙහි අන්තර්ගත සෛලයන්හි න්‍යෂ්ටියේ වර්ණ දේහ නම් අංගු අඩංගු වෙයි. ජාන තැන්පත්ව තිබෙන්නේ ඒ වර්ණ දේහවලයි. එක් එක් ජීවියා උපතින් ලබන ''ආර'' හෝ එසේ නම් ''පරම්පරාගත ලක්ෂණ'' තීරණය වන්නේ ඒ ජාන වලිනි.

කෙනෙකු උස දැයි මිටි දැයි තීරණය වන්නේත් ජාන හේතු කොට ගෙනයි. සත්වයකුගේ හෝ පැළෑටියක හෝ විශේෂ ලක්ෂණ තීරණය කෙරෙන්නේ ජාන විසිනි. යම්කිසි ජීව විශේෂයක, යම්කිසි විශේෂ වර්ණ දේහයක, යම්කිසි විශේෂ ස්ථානයක පාරම්පරික ගති ලක්ෂණ ආකාරය තීරණය කරනු ලබන්නේ ජාන විසිනි.

බහුල වශයෙන් වගා කොට ලබන, වී, තිරිඟු, බාර්ලි, ඉරිඟු, කෝපි, කොකෝවා, උක්, රබර්, කපු ආදී හැම ශාක වර්ගයක්ම ඉබේ වන ගතව වැවෙන ඒ ශාකයන් ගේ නෑදෑ ශාක වර්ගවල ජාන භාවිතයෙන් ඉහළ තත්ත්වයකට පත් කොට ගෙන ඇත්තේය.

ඒ වල් පැළෑටි වලින් ලබා ගන්නා ඉතාම අගයැති ලක්ෂණය නම්, ලෙඩ රෝගවලට හා පළිබෝධ වලට ඔරොත්තු දී සිටීමේ ශක්තියයි. වල් පැළෑටි විසින් මේ ඔරොත්තු දී සිටීමේ ශක්තිය ලබා ගෙන තිබෙන්නෙ කාලාන්තරයක් මුළුල්លේ විකාශනය වීමෙනි. නිසරු පසෙහි වැඩීමේ ශක්තියත්, නියඟ හා නියඟ වැනි විවිධ අන්තරාවල කාල ගුණයන්ට ඔරොත්තු දී සිටීමේ බලයත්, ජල ගැල්මට යට වන පෙදෙස්වල හෝ කරදිය මුසු බිම්වල හෝ වගුරු බිම් වල හෝ යහතින් ජීවත් වීමේ ශක්තියත් ඒ වල් පැළෑටි සතුව තිබිය හැකි වේ.

එවැනි විවිධ තත්ත්වයන්ට ඔරොත්තු දෙමින් වැඩෙන්නට අවශ්‍ය පාරම්පරික ශක්තිය ඒ වල් පැළෑටිවල ජානයන්හි අන්තර්ගතව පවතී. අවශ්‍ය ගති ලක්ෂණ ලබා ගන්නා පිණිස ශාක වර්ග බෝ කරන අය, වගා කොට ගෙන තිබෙන ශාක වර්ගය ඒ වල් පැළෑටි වර්ගයන් එකිනෙක හා සමඟ මුහුන් කරති. ඇතැම් විට ඔවුන් බලාපොරොත්තු වන්නේ වඩාත් ඉහළ අස්වැන්නක් විය හැකිය. මේ ප්‍රතිඵල වලින් වඩාත් විශාල පලතුරු සොයා ගන්නත්, වල් පැළෑටි සතු ජාන සම්පත් බොහෝ සේ උපකාරී වේ.

සිංහ රාජ වන අඩවියේත් නමුනුකුල (නකලස්) කඳු වැටියේ වන ගහණ වලත්, වෙනත් වනාන්තර පෙදෙස් සියල්ලෙත්, තවමත් අප නො දන්නා ජාන සම්පත් තැන්පත්ව පවතී. අප විසින් මේවා ආරක්ෂා කොට ගත යුතු වේ. මිනිසාට පිහිට වන වගා කොට ගත් ශාක වර්ග යහතින් පවත්වා ගනු පිණිස මේ වල් පැළෑටිවල ජාන සම්පත් රැක ගැනීමත් ඒවායේ විවිධත්වය ඒ අයුරින්ම පවත්වා ගෙන යෑමත් අතිශයින්ම වැදගත්ය.

වල් පැළෑටි විසින් ඒවායේ විවිධත්වයේ ද රැක ගනු ලැබේ. මෙයත් ඉතාමත් වැදගත් කරුණකි



ගොයම්, නිදර්ශනයක් වශයෙන් ගනිමු. කලකට පෙර ශ්‍රී ලංකාවේත්, ඉන්දුනීසියාවේත්, පිලිපීනයේත්, වියට්නාමයෙත් ගොයම් අක්කර 116,000 ක් සහමුලින්ම විනාශ කළ ගොයම් රෝගයක් මර්ධනය කරන්නට උපකාරී වූයේ ඉන්දියාවෙන් ලබාගන්නා ලද 'ඔරියා නිවාරා' නම් එක් වල් ගොයම් පැළෑටි විශේෂයකි.

මෙයින්, ඒ ගොයම් රෝග වයිරසය සහමුලින් ම අතුරුදහන් වූයේ ය. එපමණක් නොවේ, ඒ මගින් අයි. ආර්. 36 නම් වී වර්ගය ද බෝ කොට ගත හැකි විය. මෙය අද ලොව ඉතාම බහුල වශයෙන් කෙරෙන වී විශේෂයකි.